# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2125/23 - 2019 මැයි මස 28 වැනි අඟහරුවාදා - 2019.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස : ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය :- 4641
විශේෂ්‍ය අංකය :- කො/1181

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

1976 ජුලි මස 07 වන දාතම හා අංක 220/9 දරන ශ්‍රී ලංකා ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* විශේෂ්‍ය අංක කො/1181 දරන ප්‍රකාශනයට අදාළව පළකරන ලද අංක 2319 දරන ව්‍යවස්ථාපිත නිශ්චය මෙයින් අවලංගු කරන අතර, කොළඹ 01, හේමාස් ගොඩනැගිල්ල යන ස්ථානයේ සිසිල් අර්සකුලරත්න මයා බාරේ ලොයිඩ් ජෝෂප් අයිවර් ප්‍රනාන්දු මහතා විසින් පනතේ 18 වන වගන්තිය යටතේ කරන ලද ව්‍යවස්ථාපිත ප්‍රකාශය අනුව පනතේ 19 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිය තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය නව ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට තබා ගනීමට ඉඩ දෙනු ලබන කෘෂිකාර්මික ඉඩම් කොටස මෙහි උපලේඛනයේ දැක්වේ.

නීතිඥ සිරිමෙවන් ඩයස්,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2019 මැයි මස 28 වැනි දින,
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දී ය.

උපලේඛනය

01. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොළ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ වල්ගම්පත්තු කෝරළේ සුළු කොට්ඨාසයේ වැඋඩගම යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 692 අතිරේක අංක 01 හි දැක්වෙන වැඋඩගම එස්ටේට් නමැති ඉඩමේ අක්කර 02 රූඩ් 1 පර්. 23 ක ප්‍රමාණ ඇති ලොට් අංක 59 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහ කොළ පළතුරු හා ගොඩනැගිලිද,

02. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල උප දිසාපති කොට්ඨාසයේ වල්ගම් පත්තු කෝරළේ සුළු කොට්ඨාසයේ වැඋඩගම යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 692 හි අතිරේක අංක 12 හි දැක්වෙන පහල වෙලේ වත්ත නොහොත් වැඋඩගම වත්ත නැමති ඉඩමේ අක්කර 01 රූඩ්. 2 පර්. 05.5 ක ප්‍රමාණ ඇති ලොට් අංක 153 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලිද,

03. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල උප දිසාපති කොට්ඨාසයේ වල්ගම්පත්තු කෝරළේ සුළු කොට්ඨාසයේ වැඋඩගම යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 692 හි අතිරේක අංක 12 හි දැක්වෙන හදුගලගේ වැවගාව වත්ත නොහොත් වැඋඩගම වත්ත නැමති ඉඩමේ අක්කර 01 රූඩ් 3 පර්. 31.2 ක ප්‍රමාණය ඇති ලොට් අංක 152 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද,

04. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල උප දිසාපති කොට්ඨාසයේ වල්ගම්පත්තු කෝරළේ සුළු කොට්ඨාසයේ වැඋඩගම යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 692 හි අතිරේක අංක 11 හි දැක්වෙන සියඹලාගහමුල වත්ත නොහොත් වැඋඩගම වත්ත නැමති ඉඩමේ අක්කර 13 රූඩ් 2 පර්. 19.9 ක ප්‍රමාණ ඇති ලොට් අංක 151 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද,

05. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල උප දිසාපති කොට්ඨාසයේ වල්ගම්පත්තු කෝරළේ සුළු කොට්ඨාසයේ කටුපොත යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 691 හි අතිරේක අංක 09 හි දැක්වෙන කෝන්ගහමුල වත්ත, කොනකැඩිච්ගලගාව වත්ත, හීනගලගාව හේන නොහොත් වැඋඩගම වත්ත නැමති ඉඩමේ අක්කර 23 රූඩ් 1 පර්. 37.6 ක ප්‍රමාණය ඇති ලොට් අංක 138 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද වේ.

06 - 261

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.